සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## දෙවන වාර පරීක්ෂණය 2019

## බුද්ධ ධර්මය

6 ශ්‍රේණිය                                                                                     කාලය පැය 02 යි

| නම/ විභාග අංකයඃ |
|---|

සැලකිය යුතුයි

- පළමු කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- දෙවන කොටසේ පළමු පළමු ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

---

### I - කොටස

- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට ගැලපෙන පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරා යටින් ඉරක් අඳින්න.

01 සිදුහත් කුමාරයාගේ මව වූයේ,

(1) යශෝධරා දේවියයි. (2) මහාමායා දේවියයි.

(3) මහා ප්‍රජාපතී ගෝතමී දේවියයි. (4) කිසාගෝතමී දේවියයි.

02 යශෝධරා දේවියගේ පියා වූයේ,

(1) සුද්ධෝදන රජතුමා ය. (2) අමිතෝදන රජතුමා ය.

(3) සුප්‍රබුද්ධ රජතුමා ය. (4) කොසොල් රජතුමා ය.

03 සතර පෙරනිමිතිවල දෙවැන්න

(1) මහල්ලෙක් ය. (2) රෝගියෙක් ය. (3) මළ සිරුරක් ය. (4)පැවිදි රුවක් ය.

04 විහාරස්ථානයට ගොස් වන්දනා කරන පිළිවෙළ නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.

(1) බෝධීන් වහන්සේ, බුදු පිළිම වහන්සේ, වෙහෙර වහන්සේ.

(2) වෙහෙර වහන්සේ, බෝධීන් වහන්සේ, බුදු පිළිම වහන්සේ.

(3) බුදු පිළිම වහන්සේ, වෙහෙර වහන්සේ, බෝධීන් වහන්සේ.

(4) බුදු පිළිම වහන්සේ, බෝධීන් වහන්සේ, වෙහෙර වහන්සේ.

05 පහත දැක්වෙන වචනවලට භාවිතවන ශාසනික වචන පිළිවෙළට යෙදී ඇති පිළිතුර තෝරන්න.

* වතුර * අතුගානවා * මිදුල

(1) අමදිනවා, මලුව, පැන් (2) පැන්, මලුව, අමදිනවා

(3) පැන්, අමදිනවා, මලුව (4) අමදිනවා, පැන්, මලුව



LIVEWORKSHEETS

- **අංක 06 සිට 10 දක්වා ප්‍රකාශවල දැක්වෙන වගන්ති හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද ඉදිරියේ තිබෙන වරහනෙහි යොදන්න.**

06 මෙත් වැඩීමෙන් අපට ලැබෙන ආනිසංස ගණන 11 කි. (   )

07 කීකරුකම හා අවවාද පිළිගැනීම රාහුල හිමියන්ගේ චරිතයෙන් ගතහැකි ආදර්ශයන් ය. (   )

08 ''**ධම්මානුවත්තී**'' යන්නෙහි තේරුම කම්මැලි නැතිකම යන්නයි. (   )

09 මාතෘ භූමියෙහි සෞභාග්‍යය හා සෞන්දර්යය ජාතික ගීයෙන් හෙළිවේ. (   )

10 සම්මාවාචා හා සම්මා කම්මන්ත යන අංග දෙක පමණක් සීල ශික්ෂාවට අයත් වේ. (   )

- **අංක 11 සිට 15 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැනට ගැලපෙන පිළිතුර වරහන තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

( අනුපිය / පාණ්ඩව / මඝ / සුමන / සේනානි )

11 රජගහනුවර පිඬුසිඟා වැඩි බෝසතාණෝ ................................... පර්වතය පාමුල දී දන් වැළඳූ හ.

12 පැවිදි වූ බෝසතාණන් වහන්සේ අනෝමා ගඟ අසල ......................................... අඹ වනයෙහි විවේකයෙන් වැඩ සිටිය හ.

13 .......................................... මානවකයා අභියෝග ජයගත් තරුණයෙකි.

14 ශ්‍රද්ධාවෙන් යුතුව බුදුරදුන්ට මල් පූජා කළ ....................................... රජතුමාගෙන් ද තෑගි භෝග ලැබීය.

15 ............................................ නියම් ගමෙහි සිත්කළු වන ලැහැබක බෝසතාණෝ දුෂ්කර ක්‍රියාව සිදුකළ හ.

- **පහත A තීරුවේ දැක්වෙන තැනැත්තන් B තීරුවේ දැක්වෙන ස්ථාන සමග නිවැරදිව ගලපා යා කරන්න.**

| | A | | B |
|---|---|---|---|
| 16 | පස්වග තාපසයින් | 1. | දෙවුදහ නුවර |
| 17 | බිම්බිසාර රජතුමා | 2. | අම්බලට්ඨිකා ආවාසය |
| 18 | සුද්ධෝදන රජතුමා | 3. | කිඹුල්වත් නුවර |
| 19 | රාහුල හාමුදුරුවෝ | 4. | රජගහ නුවර |
| 20 | මහාමායා දේවිය | 5 | බරණැස ඉසිපතනය |

(ලකුණු 2 x 20 = 40)



LIVEWORKSHEETS